**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය-2013**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාව 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**02. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම, හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදී පරීක්ෂාවේදී අනාවරණය වු පරිදි 2014 වර්ෂයට අදාළ වියදම්, 2013 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් හා උපචිත වියදම් රු.72,167 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ආයතනය සතුව පවතින වර්ග අඩි 3848 වූ ගොඩනැගිලි 04 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.

**2.2.2 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි යනාදියට යොමුව<br>-------------------- | අනුකූල නොවීම<br>------------------- |
|---|---|---|
| (අ) | 2004 ජුනි 29 දිනැති අංක 25 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.33,594,075 ක් වටිනා ආයෝජන සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒ/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**03. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,301,901 ක, අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,194,894 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.4,107,007 කින් වැඩිවීම සඳහා රජයේ ප්‍රදාන රු.3,479,000 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

**04. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යයසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 වන විට කාර්ය පැවරුම් පදනම මත බඳවාගත් සේවකයින් 35 දෙනෙකු සිටින අතර ඔවුන්ගෙන් සේවකයින් 11 දෙනෙකු වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු අතර සේවා කාලය වසරින් වසර දීර්ඝ කර තිබුණි.

(ආ) පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනයට සෘජුවම දායක වන පටක රෝපණ විද්‍යාගාර හා හරිතාගාරවල සියලුම සේවකයින් සහ මෙහෙයුම් සහ අධීක්ෂණ කටයුතු කරන නිළධාරීන් සඳහා අනුමත සේවක මණ්ඩලයක් පවත්වා ගැනීමට කටයුත කර නොතිබුණි.

**05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා ඵලදායීව යොදාගැනීමට හා මඟපෙන්වීමට හැකිවනු පිණිස සමාලෝචිත වර්ෂයට පෙර සංයුක්ත සැලැස්ම සකස්කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබායුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5.2 **ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------**

මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය සඳහා නිලධාරීන්ට වගකීම් පැවරෙන පරිදි සමාලෝචිත වර්ෂයට පෙර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර 2013 වර්ෂයේදී ළඟාකර ගැනීමට / ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක සහ එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

**06. පද්ධති හා පාලන**

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) පාඨමාලා ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීම

(ඇ) අත්තිකාරම් පාලනය